**ශීර්ෂය 297- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1. ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | 2021 දෙසැම්බර් 30 දින අන්තර්ජාල ලැබීම් වලින් රාජ්‍ය ආදායමට අදාළ 1/3 ක කොටස රු.425,050 ක් විය යුතු වුවත් එය රු.361,550 ක් ලෙස රු.63,500 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට ගලපා තිබුණි. | 2021 දෙසැම්බර් 30 ආදායම ගණනය කිරිමේදි වැරදිමකින් 2021 නොවැම්බර් 30 දින ලද ආදායම ගැනිම නිසා මෙම වෙනස ඇති වී ඇති බව සහ එය නිවැරදි කිරිමට කටයුතු කරන බව. | අන්තර්ජාල ආදායම නිවැරදිව හඳුනා ගත යුතුය. |
| **(ii)** | ACA 1 ආකෘති අනුව ආදායම් ශීර්ෂ 20.03.02.10 යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ආදායම රැස් කිරීම රු.239,440,768 ක් විය. ඉන් රු.119,599,829 ක් ආදායමින් ආපසු ගෙවීම් ලෙස දක්වා ඇතත් එය මුදල් රෙගුලාසි 118 ප්‍රකාරව ආදායමෙන් ආපසු ගෙවීමක් නොවූ අතර එය සමාගම් අරමුදලින් ඒකාබද්ධ අරමුදලට ලබාදී තිබූ අත්තිකාරම් මුදලට අදාළව වර්ෂය තුළ හිලවු කළ මුදල විය. මේ හේතුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ලැබීම් වටිනාකම අත්තිකාරම් සඳහා හිලවු කළ ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ආදායම් ශිර්ෂ 20.03.02.10 යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබිම් ලෙස දක්වා ඇත්තේ සත්‍ය වශයෙන්ම එකතු කරන ලද ආදායමින් අත්තිකාරම් ලෙස භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ලබා දි ඇති මුදල් හිලව් කර ගත් පසු මුදල බව සහ එය මාසිකව භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳිම් කර වර්ෂ අවසානයේ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් සමඟ සැසඳිම නිසා ACA 1 ආකෘතියේ ශුද්ධ ආදායම ලෙස දක්වා ඇති බව. | ආදායම් ශීර්ෂයට අදාළ වර්ෂය තුළ රැස්කළ ආදායම කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතුය. |

(ආ) පුනරාවර්තන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්වල වටිනාකම වූ රු.890,499 ක් එම වියදම යටතේ දක්වනු වෙනුවට පොළී ගෙවීම් යටතේ දක්වා තිබුණි. | රජයේ නිලධාරීන්ගේ දේපළ ණය පොළිය මෙසේ වැරදිමකින් පොළී ගෙවීම් යටතේ දක්වා ඇත. එය නිවැරදිව දැක්වීමට සටහන් කර ගත් බව. | වැය විෂය නිවැරදිව හඳුනාගත යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ (ACA – 1(i)) හිඟ ආදායම් දැක්වීමේදී පසුගිය වසරට අදාළ රු.894,462,000 ක හිඟ මුදල හා පසුගිය වසරට පෙර වසර වන විට වූ රු.226,853,316 ක හිඟ මුදල දක්වා ඉන් සමාලෝචිත වර්ෂයේ අයකර ගැනීම් වෙන් වෙන්ව අනාවරණය කළ යුතු වුවද එසේ කර නොතිබුණි. | පෙන්වා දි ඇති පරිදි සමාලෝචිත වර්ෂයේ අය කර ගැනිම් වෙන් වෙන්ව දැක්වීමට සටහන් කර ගත් බව. | වසරට අදාළ හිඟ මුදල, පසුගිය වසරට අදාළ හිඟ මුදල හා පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල් වලින් අයකර ගැනීම් වෙන වෙනම අනාවරණය කළ යුතුය. |
| (ආ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 131 ප්‍රකාරව සෑම සමාගමක්ම වාර්ෂික වාර්තා භාරදිය යුතු වුවද 2007 වර්ෂයේ සිට 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව වාර්ෂික වාර්තා ගොනු නොකළ සමාගම් 498,633 කින් අයවිය යුතු ආදායම රු.2,991,798,000 ක් ව තිබුණි. 2007 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව 2019, 2020 හා 2021 වර්ෂයන්හිදී ගොනු කළ වාර්ෂික වාර්තා ප්‍රමාණය පිළිවෙලින් 22,269, 5,744 සහ 4,277 ක් වී තිබූ අතර හිඟ වාර්ෂික වාර්තා ගොනුකිරීම් ක්‍රමිකව අඩුවෙමින් පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි. | වාර්ෂික වාර්තා ගොනු නොකළ සමාගම් හඳුනා ගෙන එම වාර්තා ගොනුගත කිරීමට යොමුකර හිඟ ආදායම් අයකර ගැනීමේ කාර්යසාධනය වැඩි කළ යුතුය. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 වන රෙගුලාසිය | රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාරගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ බඩුබාහිරාදිය නිකුත් කිරීම සම්බන්ධයෙන් පරිපාලනමය වශයෙන් වගකිව යුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති හෝ නිලධාරීන්, වවුචර් අත්සන් කරන අයද ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටුකරන බවට ඇප තැබිය යුතු වුවද මුදල් අයකැමිවරු, ගණකාධිකාරී, ඇතුළු නිලධාරීන් ඇප තැන්පතු තබා නොතිබුණි. | ඇප තැන්පත් කළ යුතු නිලධාරින් පිළිබඳව සොයා බලා ඇප මුදල් අය කර ගැනිමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැන්පතු තැබීමට කටයුතු කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ දූර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **2004** ඔක්තෝබර් **11** දිනැති අංක **118** දරන අයවැය චක්‍රලේඛයේ **1.1.7** වගන්තිය ප්‍රකාරව ස්ථාන මාරුවන නිලධාරීන්ගේ ණය ශේෂ ස්ථාන මාරු වී මාස **03** ක් ගතවීමෙන් පසු නිරවුල් නොවූ ණය ශේෂ ලෙස නොපෙන්වීමට වගබලා ගත යුතු වුවත්, වෙනත් දෙපාර්තමේන්තු වෙත ස්ථාන මාරු වී ගිය නිලධාරීන් තිදෙනෙකුට අදාළව රු. **120,741** ක මුදලක් ස්ථාන මාරු වී වසර **20** ත් **32** ත් අතර, කාලයක් ගතවී ඇතත්, නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම මුදල පොත් වලින් කපා හැරිම සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළ අතර එම ණය ශේෂ කපා හැරිමට අවශ්‍ය ගැලපිම් කරගැනීමට කටයුතු කරමින් පවතින බව. | නොපියවූ ණය ශේෂ නිරවුල් කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු

---------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------- | ---------- |
| අ) | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව දිළිඳුකම තුරන් කිරීම, සෑම අතින්ම පවතින කුසගින්න නැති කිරීම හා තිරසාර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායීතාවයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම, සියලු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම, තිරසර සංවර්ධන අරමුණු ලෙස හඳුනාගෙන තිබූ අතර එහි ලියාපදිංචි කරන සමිති හා සමාගම් සංඛ්‍යාව වැඩි කිරීම, මූලික ඉලක්ක දෙකක් ලෙස දක්වා තිබුණි. එසේ වුවද එම ඉලක්ක ළඟා කරගැනීමට දෙපාර්තමේන්තුවට විශේෂ පරිශ්‍රමයක් දැරීම අවශ්‍ය නොවන බැවින් හඳුනාගත් අරමුණු සම්බන්ධයෙන් වන ඉහත සඳහන් ඉලක්ක කෙරෙහි නැවත අවධානය යොමු විය යුතු බව නිරීක්ෂණය විය. | මේ සම්බන්ධයෙන් නැවත අවධානය යොමු කරන බව | හඳුනාගත් තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක කෙරෙහි නැවත අවධානය යොමු විය යුතුය. |
| ආ) | ව්‍යාපාර කිරීම පහසු කිරීමේ දර්ශකයෙහි ඉහළ අගයක් ශ්‍රී ලංකාවට හිමිකර දීම හා ලියාපදිංචි වන පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාව වැඩි කිරීම යන ඉලක්ක ළඟා කර ගැනීමේදී පාදක දත්ත හා ඉලක්ක ළඟාවිය යුතු සංධිස්ථානයන් හා ප්‍රගතිය මැන බැලීමේ දර්ශක පැහැදිළිව හඳුනාගෙන නොතිබුණි. | මෙම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට සටහන් කරගන්නා ලද බව. | ඉලක්ක ළඟා කර ගැනීමේදී පාදක දත්ත හා ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් හා ප්‍රගතීන් මැන බැලීමේ දර්ශක පැහැදිලිව හඳුනාගත යුතුයි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **e-Roc** ව්‍යාපෘතිය හරහා දෙපාර්තමේන්තු සියලු කටයුතු මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක වන පසුබිමක තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ තනතුරට හා සහකාර අධ්‍යක්ෂ තනතුර යන තනතුරු දෙකම පුරප්පාඩු වීම පද්ධතියේ කාර්යසාධනයට මෙන්ම ඉදිරි කටයුතු සඳහා ඍජු බලපෑමක් පවතින බව නිරීක්ෂණය විය. | මෙම තනතුරු සඳහා නිලධාරියෙක් පත් කර එවන ලෙස නිරන්තරයෙන් ලිපි රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කරන බව. | පුරප්පාඩු වූ තනතුරු සඳහා නිලධාරින් පත් කර ගැනීමට කටයුතු කළ යුතුය. |